৶ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2074/13 - 2018 ජුනි මස 05 වැනි අඟහරුවාදා - 2018.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියෝගය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, විදේශ කටයුතු අමාත්‍ය තිලක් මාරපන වන මම, සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2005, දෙසැම්බර් 07 වැනි දින එළඹි ගිවිසුමෙහි, මෙහි උපලේඛනයේ සඳහන් වන එකී ගිවිසුමෙහි අදාළ වගන්තිවල නියමයන්, බලාත්මක කිරීම සඳහා අවශ්‍යවන ප්‍රමාණයට, ඉහත කී පනතේ විධිවිධාන, සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා සම්බන්ධයෙන් අදාළවිය යුතු යයි මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත් කරමි.

තිලක් මාරපන, පා.ම.
විදේශ කටයුතු අමාත්‍ය.

2018 ජුනි මස 04 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

***සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර ගිවිසුමේ අංක VII, VIII, IX, X, XI, XII සහ XIII වන වගන්ති***

*VII වගන්තිය*

**වරප්‍රසාද සහ විනිර්මුක්ති**

1. ආණ්ඩුව විසින් සිය දේපළ, අරමුදල් හා වත්කම් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයට, එහි නිලධාරීන්ට සහ පොදු සම්මුතියට අදාළ දූත මණ්ඩල විශේෂඥයින්ට අදාළ කළ යුතු ය. (වත්මන් ගිවිසුමේ IV වගන්තියට අමුණා ඇත) ජාත්‍යන්තර වශයෙන් සරණාගතයින් ආරක්ෂා කිරීමත් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ මානව හිතවදී කටයුතුවලදී අවශ්‍යවන්නා වූ අතිරේක වරප්‍රසාද හා මුක්ති සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයටත් එහි සේවා පිරිස්වලටත් ලබාදීමට ද රජය එකග වන්නීය.

2. මෙම වගන්තියේ පළමුවන ඡේදයට අගතියක් නොවන පරිදි රජය විසින් විශේෂයෙන්ම මෙම ගිවිසුමේ අංක VIII සිට X දක්වා වගන්තිවල සඳහන් ප්‍රතිලාභ මුක්ති අයිතිවාසිකම් හා පහසුකම් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලයටත්, එහි සේවා පිරිස්වලටත් භුක්ති විඳීමට අවකාශ සලසා දිය යුතු ය.

1A - PG 4064 — 507 (2018/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## *VIII* වගන්තිය

1. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලය, දේපළ, අරමුදල් හා වත්කම් සරණාගතයින් පිළිබඳ කාර්යාලයේ යම් දේපළක්, අරමුදලක් හෝ වත්කමක් පිළිබඳ නිර්මුක්තභාවය ප්‍රකාශිතවම අත්හැර දමා ඇත්නම් එම අත්හැර දැමීම කිසියම් ආකාරයකින් ක්‍රියාත්මක කිරීමක් බවට පත්විය යුතු නොවිය යුතු යයි අවබෝධ කරගෙන ඇත්නම් ඒවා හැරුණු විට සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ අනෙකුත් සියලුම දේපළ අරමුදල් හා වත්කම් කොහේ පිහිටියත් කවරෙකු සතුව පැවැතියත් ඒවා විනිර්මුක්ත විය යුතු ය.

2. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලයේ පරිශ්‍රය නොකෙලෙස විය යුතු ය. එක්සත් ජාතීන්ගේ දේපළ, අරමුදල් හා වත්කම් කොතැනක පිහිටා තිබුණත් කවරෙකු සතුව පැවැතියත් ඒවා පරීක්ෂා කරනු ලැබීමෙන්, අධිග්‍රහණයෙන්, රාජසන්තක කරනු ලැබීමෙන්, බුක්තිය පැහැර ගනු ලැබීමෙන් හෝ වෙනත් ආකාරයක නියමයකින් විනිර්මුක්ත විය යුතු ය.

3. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා ලේකම් කාර්යාලයේ ලේඛනාගාරය හා පොදුවේ එහි සියලුම ලියකියවිලි කොතැනක තිබුණත්, කවරෙකු භාරයේ පැවැතියත් ඒවා නොකෙළෙසවිය යුතු ය.

4. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා ලේකම් කාර්යාලයේ අරමුදල්, වත්කම්, ආදායම් හා වෙනත් දේපළ පහත සඳහන් බදු වලින් නිදහස් විය යුතු ය.

අ) ඕනෑම ආකාරයක ඍජු බදු වලින් (කෙසේවුවද, පොදු ප්‍රයෝජ්‍යතා සේවා සඳහා වන බදු නොගෙවූ ගාස්තු සම්බන්ධයෙන් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය බදු නිදහස ඉල්ලා නොසිටී.

ආ) සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලය එහි නිල කාර්යයන් සඳහා ආනයන හෝ අපනයනය කරනු ලබන භාණ්ඩ පිළිබඳ තීරු බදු තහනම් කිරීම් හා සීමා කිරීම් සම්බන්ධයෙන් කෙසේවෙතත් රජය සමග ගිවිස ගන්නා ලද කොන්දේසි යටතේ විනා එලෙස බදු නිදහස යටතේ ආනයනය කරන ලද එවැනි භාණ්ඩ රට තුළ අලෙවි නොකළ යුතු ය.

ඇ) ප්‍රකාශන වශයෙන් කරන ලද ආනයන හා අපනයන පිළිබඳ රේගු ගාස්තු, තහනම් කිරීම් හා සීමා කිරීම්,

5. මෙහි පහත XI වගන්තියේ විස්තර කර ඇති ආකාරයට අංක පීආර්/පීඕඑල්/01 හා 2002 ජූනි 04 දිනැති සන්ධාන සටහන යටතේ ප්‍රදානය කර ඇති වටිනාකම එකතු කළ බදුවලින් හා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවලට සලසා දී ඇති වෙනත් තීරු බදු වලින් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ හා ජාත්‍යන්තර නිලධාරීන්ට සලසා දී ඇති ආනයන හා සැපයුම් භාණ්ඩ නිදහස් කරනු ලැබේ.

6. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය මගින් කෙළින්ම ආනයනය කරනු ලබන අපනයනය කරනු ලබන හෝ දේශීය වශයෙන් මිලට ගනු ලබන භාණ්ඩ හා සරණාගතයින් සඳහා මානව හිමිකම් ආධාර ලබා ගැනීමේදී එම කාර්යාලය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අක්ත ගන්වන ලද ජාත්‍යන්තර ක්‍රියාකාරී පාර්ශ්වකරුවෙකු මගින් ආනයනය කරනු ලබන, අපනයනය කරනු ලබන හෝ දේශීය වශයෙන් මිළට ගනු ලබන භාණ්ඩ පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලය සරණාගතයින් එම භාණ්ඩ තීරුබදු වලින් තහනම් කිරීම් හා සීමා කිරීම් වලින් නිදහස් වේ.

7. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය මූල්‍ය පාලනයන්ට, රෙගුලාසිවලට හෝ විලම්බන කාලයන්ට යටත් නොවිය යුතු අතර

(අ) බලයලත් වාණිජ-නියෝජිතායතන මගින් භාණ්ඩ මිළට ගැනීමත්, පරිවර්ත්‍ය මුදල් සතුව තබා ගැනීමට හා ගනුදෙනු කිරීමටත්, විදේශීය ව්‍යවහාරික මුදල් ගිණුම් පවත්වාගෙන, යාමටත් බලයලත් ආයතන මගින් භාණ්ඩ ලබා ගැනීමටත් අරමුදල් සුරකුම් පත් හා ධනය භාරයේ තබාගෙන පාවිච්චි කිරීමටත් ;

(ආ) සත්කාරක රටට අරමුදල්, සුරකුම්පත්, විදේශ ව්‍යවහාරික මුදල් සහ ධනය වෙනත් ඕනෑම රටකින් ගෙන්වා ගැනීමටත්, සත්කාරක රට තුළදී ඒවා භාවිතා කිරීමටත් ඒවා වෙනත් රටවල් සමග හුවමාරු කර ගැනීමටත් ;

එම කාර්යාලයට නිදහස තිබේ.

8. වඩාත්ම වාසිදායක නෛතික විනිමය අනුපාතිකය අනුව සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමසාරිස් කාර්යාලයට කටයුතු කළ හැකි ය.

## *IX* වගන්තිය

### සන්නිවේදන පහසුකම්

1. නිල සන්නිවේදන කටයුතුවලදී තීරු බදු, හා තැපැල් ගාස්තු, විදුලි පණිවුඩ, ටෙලි ඡායා රූප දුරකථන, විදුලි පණිවුඩ, ටෙලෙක්ස් පණිවුඩ සහ වෙනත් සන්නිවේදන කටයුතු මෙන්ම පුවත්පත්වලට හා ගුවන්විදුලියට ලබා දෙන තොරතුරු ආදිය සම්බන්ධයෙන් රජය, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල ඇතුළු වෙනත් රටවල ආණ්ඩුවලට හෝ අන්තර් රාජ්‍ය අන්තර්ජාතික ආයතන කෙරෙහි රජය දක්වන රාජ්‍යතාන්ත්‍රික ප්‍රමුඛතාවලට නොඅඩු සැලකිල්ලක් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයට හිමිවිය යුතු ය.

2. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ නිල සන්නිවේදන හා ලිපි හුවමාරුව සම්බන්ධයෙන් අලංඝනීයභාවය රජය විසින් ආරක්ෂා කරනු ලැබිය යුතු අතර එම කාර්යාලයේ සන්නිවේදන හා ලිපි ගනුදෙනු සම්බන්ධයෙන් වාරණ නොපැමිණ විය යුතු ය. එම අලංඝනීයභාවය ප්‍රකාශන ඡායාරූප, ස්ලයිඩ, චිත්‍රපට සහ ශබ්ද පටිගත කිරීම් කෙරෙහි ද සීමාවකින් තොරව අදාළ විය යුතු ය.

3. සන්නිවේදන කටයුතුවලදී සංකේත භාවිතා කිරීමටත් ලිපි ලේඛන හා වෙනත් ද්‍රව්‍ය කුරියර් මගින් හෝ මුද්‍රා තබන ලද මලු මගින් යැවීමට හා ලබා ගැනීමටත් සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයට අයිතියක් තිබෙන අතර රාජ්‍යතාන්ත්‍රික කුරියර්වලට හා මලුවලට ලැබෙන වරප්‍රසාද හා විනිර්මුක්ත ඒවාටද හිමිවිය යුතු ය.

4. ජාත්‍යන්තර විදුලි සන්දේශන සංගමයේ දැනට බලාත්මකව පවතින න්‍යාය හා රෙගුලාසි යටතේ ප්‍රවීණ ජාතික බලධාරීන් විසින් වෙන්කර දී ඇති හෝ සමායෝජනය කරනු ලබන වාර ගණන අනුව ජාලවල චන්ද්‍රිකා සන්නිවේදන පද්ධති පිළිබඳ කටයුතු ඇතුළුව ගුවන් විදුලිය හා වෙනත් විදුලි සන්දේශ උපකරණ ක්‍රියාත්මක කිරීමට සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලයට හැකිව තිබෙන බව රජය විසින් තහවුරු කර ගත යුතුවේ.

### *X* වන වගන්තිය

### සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ වාහන

1. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජිතයෙක් රට තුළ සේවය කරමින් සිටින කාලය තුළදී ඔහුට, කලත්‍රයාට හා යැපෙන්නන්ට, සාමාන්‍යයෙන් රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයන්ට ලැබෙන වරප්‍රසාද, මුක්ති, නිදහස් කිරීම් හා පහසුකම් ලැබිය යුතු ය. මේ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඔවුන්ගේ නම් රාජ්‍යතාන්ත්‍රිකයින්ගේ ලැයිස්තුවට ඇතුළත් කළ යුතු වේ. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් රට තුළ සේවය කරමින් සිටින කාලය තුළදී ඔවුන්ට පහත සඳහන් පහසුකම්, වරප්‍රසාද හා මුක්තීන් හිමිවිය යුතු වේ.

(අ) පෞද්ගලිකව අත්අඩංගුවට ගැනීමෙන් හා රඳවා ගනු ලැබ සිටීමෙන් වැළැකීමේ නිදහස

(ආ) ඔවුන් විසින් රාජකාරි කටයුතු වලදී කියන දේ, ලියන දේ හා වෙනත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නෛතික වශයෙන් ලැබෙන මුක්තිය හා එම මුක්තිය සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ සේවය අවසන්වීමෙන් පසුවද ඔවුන් සතුව තිබීම.

(ඇ) සිය රාජකාරි බඩු බාහිරාදිය පරීක්ෂා කිරීමෙන් හෝ පරිග්‍රහණයෙන් මිදීම.

(ඈ) හමුදා සේවය හෝ වෙනත් අනිවාර්ය සේවාවලින් මිදීම.

(ඉ) ඔවුන් ඔවුන්ගේ කලත්‍රයන්, ඥාතීන්, ඔවුන්ගෙන් යැපෙන්නන් ඔවුන්ගේ නිවෙස්වල සෙසු සාමාජිකයින් ආගමන විගමන පරීක්ෂාවලින් හා විජාතිකයින් පිළිබඳ පරීක්ෂා වලින් මිදීම.

(ඊ) සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ රාජකාරි සම්බන්ධයෙන් හා මානව හිතවාදී වැඩසටහන් වලට සහභාගී වීම සඳහා යන විදේශ ගමන් බිමන්වලදී වීසා බලපත්‍ර, අවසර පත්‍ර ආදිය ගාස්තු අයකිරීමකින් තොරව කඩිනමින් නිකුත් කිරීම හා නිශ්කාශණය කිරීම.

(උ) ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ වෙනත් අංශවලට ලබාදෙන හුවමාරු කර ගැනීම පිළිබඳ වරප්‍රසාද සඳහා හිමිකම් ලැබීම.

(ඌ) රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයින්ට ජාත්‍යන්තර වශයෙන් අර්බුද ඇතිවන අවස්ථාවලදී එම නිලධාරීන්ට, ඔවුන්ගේ කලත්‍රයින්ට ඔවුන්ගෙන් යැපෙන ඥාතීන්ට සහ පවුලේ අනෙකුත් සාමාජිකයින්ට ආරක්ෂාව හා නැවත සිය රටට යාමේ පහසුකම් ලබා දීම.

(එ) i. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට තනතුර ලබාගත් දින සිට මාස 6 ක කාලයක් තුළ ඔවුන්ට අවශ්‍ය ලී බඩු, උපකරණ, මෝටර් රථ තෑගි දීම සඳහා හෝ විකිණීම සඳහා හෝ නොව හුදෙක් පෞද්ගලික පාවිච්චියට ගන්නා වෙනත් දේ තීරු බදු හා වෙනත් ගාස්තු අය කිරීමෙන් තොරව ආනයනය කිරීමේ අයිතිය ලබා දීම.

එවැනි නිදහස් කිරීම් යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ සාමාන්‍යයෙන් පාවිච්චියෙන් පසු නැවත අපනයනය කළ යුතු වන අතර, රජය සමග ඇති කරගනු ලබන ගිවිසුමක් අනුව පූර්ව අනුමැතිය ලබා ගෙන මිස එසේ නොමැතිව ඒවා ශ්‍රී ලංකාවේ දී අලෙවි නොකළ යුතු ය. ඒවා ශ්‍රී ලංකාවේ දී අලෙවි කළහොත් ඒවා සඳහා සාමාන්‍ය තීරු බදු සහ වෙනත් අය බදු ගෙවිය යුතු ය.

ii. ශ්‍රී ලංකාවේ තනතුරෙහි රාජකාරි භාර ගැනීමෙන් පසුව, තෑගි දීම සඳහා හෝ විකිණීම සඳහා නොව හුදෙක්ම පෞද්ගලික පාවිච්චියට හා පරිභෝජනයට අවශ්‍ය භාණ්ඩ සාධාරණ ප්‍රමාණයක් අදාළ කාර්ය පරිපාටිවලට හා ශ්‍රී ලංකා රජයත් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනක් අතර ඇති කර ගෙන තිබෙන කාර්ය පරිපාටිවලට අනුකූලව තීරු බදු වලින් වෙනත් අයකිරීම්වලින් මෙන්ම තහනම් කිරීම් වලින් සහ සීමා කිරීම් වලින් තොරව නිදහසේ ආනයනය කිරීමට ඔවුන්ට ඉඩකඩ සලසා තිබේ.

iii. සත්කාරක රටේ පුරවැසියන්ද නිත්‍ය පදිංචිකරුවන්ද වන සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන්ට ද පොදු සම්මුතියේ සඳහන් වරප්‍රසාද හා මුක්තීන් හිමි වේ.

*XI වන වගන්තිය*

**පැය ගණන් අනුව ගෙවීම් ලබන දේශීය වශයෙන් සේවයට බඳවා ගන්නා පුද්ගලයින්**

1. සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ සේවය සඳහා පැය ගණන් අනුව ගෙවීම් ලබන දේශීය වශයෙන් සේවයට බඳවා ගන්නා පුද්ගලයින් රාජකාරි කටයුතුවලදී කියන දේ, ලියන දේ හා වෙනත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාවලියට යටත් නොකරනු ලැබේ.

2. පැය ගණන් අනුව ගෙවීම් ලබන දේශීය වශයෙන් සේවයට බඳවා ගන්නා පුද්ගලයින්ගේ සේවා නියුක්තිය පිළිබඳ නියමයන් හා කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිවලට හා රෙගුලාසිවලට අදාළ වන එක්සත් ජාතීන්ගේ අදාළ රෙගුලාසි හා රීති වලට අනුකූලව සකස් කරනු ලැබේ.

*XII වන වගන්තිය*

**දූත මණ්ඩලයේ විශේෂඥයින්**

1. සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ දූත මණ්ඩලවල සේවයේ නියුක්ත විශේෂඥයින්ට සිය රාජකාරි ස්වාධීනව ඉටු කිරීමට හැකිවන ආකාරයෙන් අවශ්‍ය පහසුකම්, වරප්‍රසාද හා විනිර්මුක්තීන් සලසා දෙනු ලැබේ. විශේෂයෙන් පහත සඳහන් වරප්‍රසාද හා පහසුකම් ඔවුන්ට ලැබේ :-

(අ) පෞද්ගලිකව අත්අඩංගුවට ගැනීමෙන් හා රඳවා ගැනීමෙන් තොර වීම,

(ආ) ඔවුන් විසින් රාජකාරි කටයුතුවලදී කියන දේ, ලියන දේ හා වෙනත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නෛතික වශයෙන් මුක්තිය ලැබෙන අතර එම මුක්තිය සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ සේවය අවසාන වීමෙන් පසුවද ඔවුන් සතුව පවතිනු ඇත.

(ඇ) සියලුම ලියකියවිලි හා ලිපිලේඛන පිළිබඳ කඩ කිරීම් සම්බන්ධයෙන් වගකීම් නොපැවරේ.
සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ සේවය අවසන් වීමෙන් පසුවද, එම අයිතිය ඔවුන් සතුව පවතිනු ඇත.

(ඈ) ඔවුන්ගේ නිල සන්නිවේදන කටයුතු සම්බන්ධයෙන් සංකේත භාවිතා කිරීමටත් කුරියර් සහ මුද්‍රා තබන ලබන තැපැල් මලු මගින් ලියකියවිලි ලබා ගැනීමට හා ලිපි හුවමරු කර ගැනීමටත් ඔවුන්ට අයිතියක් තිබේ.

(ඉ) ව්‍යවහාර මුදල් හා විනිමය පිළිබඳ සීමා සම්බන්ධයෙන් දූත මණ්ඩල තාවකාලික සේවාවන් සඳහා පිටරට ගොස් සිටින නිලධාරීන්ට හිමිවන මුක්තිය මොවුන්ට ද හිමි වේ.

(ඊ) පෞද්ගලික ගමන් මලු පරීක්ෂාවට භාජනය කිරීමෙන් හා පරිග්‍රහණය කිරීමෙන් වැළැකීම පිළිබඳ වරප්‍රසාදය මොවුන්ට ද හිමි වේ.

*XIII වගන්තිය*

1. මෙම පාර්ශ්ව වෙනත් ආකාරයකට එකඟ වී නොමැත්තේ නම්, දේශීය වශයෙන් සත්කාරක රටේ රැකියාවේ යොදවා ඇති එරටේ ජාතිකයන් හැර, සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා වෙනුවෙන් සේවය ලබාදෙන සියලුම පුද්ගලයන්ට එම ආණ්ඩුව, පොදු සම්මුතියේ 18 වැනි කොටසේ V වැනි වගන්තියේ විශේෂයෙන් දක්වා ඇති වරප්‍රසාද හා විනිර්මුක්තීන් ප්‍රදානය කළ යුතු ය. ඊට අමතරව, ඔවුනු,

(අ) ඔවුන්ගේ කාර්ය කටයුතු ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍යවන වීසා බලපත්, බලපත් හෝ අවසර පත් සඳහා අවශ්‍ය අප්‍රමාදව නිෂ්කාශන කටයුතු ඉටුකිරීම හා ඒවා ගාස්තු රහිතව නිකුත් කිරීම.

(ආ) සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ මානුෂීය වැඩසටහන්වල ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණයට එම රට තුළ, එම රට තුළට හෝ එම රටින් නිදහසේ යාම් ඊම් සඳහා අවකාශ සලසා දිය යුතු ය.

*XIV වගන්තිය*

**විනිර්මුක්තීන් ලබා දීමෙන් වැළකී සිටීම**

සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ සේවක මඩුල්ල වෙත වරප්‍රසාද හා විනිර්මුක්තීන් ප්‍රදානය කරනු ලබන්නේ ඊට අදාළ එක් එක් පුද්ගලයාගේ පෞද්ගලික යහපත තකා නොව එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ යහපත තකාය. එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාට සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ සේවක මඩුල්ලේ යම් පුද්ගලයෙකුට විනිර්මුක්තීන් ලබා දීමෙන් වැළකී සිටීමට අදහස් කරයි නම් හා එම විනිර්මුක්තය මගින් අධිකරණ ක්‍රියාවලියට බාධා පමුණුවයි නම් එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා සරණාගතයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ යහපතට අගතියක් නොවන පරිදි යම් විනිර්මුක්තියක් ලබාදීමෙන් වැළකී සිටිය හැකිය.

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියෝගය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, විදේශ කටයුතු අමාත්‍ය තිලක් මාරපන වන මම, ඇමරිකා එක්සත් ජනපද ආණ්ඩුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2018, පෙබරවාරි 26 වැනි දින එළඹී ගිවිසුමේ, මෙහි උපලේඛනයේ සඳහන් වන එකී ගිවිසුමෙහි අදාළ වගන්තිවල නියමයන්, බලාත්මක කිරීමට අවශ්‍යවන ප්‍රමාණයට, ඉහත කී පනතේ විධිවිධාන, සාම බලකා වැඩසටහන සම්බන්ධයෙන් අදාළ විය යුතු යයි මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත් කරමි.

තිලක් මාරපන, පා.ම.
විදේශ කටයුතු අමාත්‍ය.

2018 ජුනි මස 04 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සාම බලකා වැඩසටහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඇමරිකා එක්සත් ජනපදය අතර මෙම ගිවිසුමේ II, III, IV, V වැනි වගන්ති***

*II වැනි වගන්තිය*

1. ශ්‍රී ලංකා රජය විසින් ස්වේච්ඡා සේවකයන් හා සාම බලකායන් සමග ගිවිසුම යටතේ කටයුතු සිදුකරන පුද්ගලයන් හා ඔවුන්ගේ යැපෙන්නන් හා දේපළවලට සමානව සැලකීමේ එකඟතාවය ද, ශ්‍රී ලංකාවේ පදිංචි එක්සත් ජනපදයේ ජාතිකයන්ට පොදුවේ එකඟ වූ ඊට අඩු නොවන ප්‍රිය මනාපව සැලකීමද ඇතුළුව, ඔවුන් සහ ඔවුන්ගේ දේපළවල පූර්ණ ආධාරය හා ආරක්ෂාව සඳහා එකඟතාවය ද, ඔවුන්ට අදාළව සියලුම කරුණු සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ නියෝජිතයන් සමග පූර්ණ දැනුවත්භාවය, උපදේශනය හා සහයෝගය ලබා දිය යුතු ය.

2. ශ්‍රී ලංකා රජය විසින් ;

(අ) සිය ජීවන වියදම් දරා ගැනීම සඳහා තමන් වෙත ලැබෙන ගෙවීම්, ස්වකීය නිල රාජකාරිවලින් පැන නගින ආදායම, සහ ශ්‍රී ලංකාවෙන් පිටත අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ආදායම් හා සම්බන්ධ බදු ද ;

(ආ) සිය භාවිතය සඳහා ශ්‍රී ලංකාවට ගෙනඑන ලද සිය පුද්ගලික දේපළ සම්බන්ධයෙන් රේගු බදු හා අනෙකුත් අය කිරීම් ;
සම්බන්ධයෙන් එම නිදහස් කිරීම් ස්වේච්ඡා සේවකයන්ට ලබාදිය යුතු ය. එමගින් රාජ්‍යතාන්ත්‍රික සබඳතා සම්බන්ධයෙන් වියානා සම්මුතියට අනුව එක්සත් ජනපද තානාපති කාර්යාලයේ පරිපාලන හා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට විධිවිධාන සලසයි.

3. ශ්‍රී ලංකා රජය විසින්, විශේෂඥයන්, ජ්‍යෙෂ්ඨ ස්වේච්ඡා සේවකයන්, දූත මණ්ඩල සාමාජිකයන් හා ශ්‍රී ලංකාවේ ඒ හා සමාන දූත මණ්ඩලයක කටයුතු කරන ඕනෑම ජාත්‍යන්තර සංවිධානයක ඔවුන්ගේ පවුල් සඳහා ශ්‍රී ලංකා රජය විසින් අවසරපත් හා වීසා බලපත්‍ර නිකුත් කරන එවැනි මට්ටමට වඩා අඩු නොවූ සමාන මට්ටමකින් ස්වේච්ඡා සේවකයන් වෙත වාස බලපත්‍ර සහ වීසා බලපත්‍ර නිකුත් කළ යුතු අතර, එවැනි වාසබලපත්‍ර සහ බහුවිධ ප්‍රවේශ වීසාබලපත්‍ර නිකුත් කිරීම් ගාස්තු හෝ වෙනත් අයකිරීම් ඇතුළත් නොකළ යුතු ය.

*III වැනි වගන්තිය*

1. ස්වකීය කාර්යයන් සඵලදායීව සිදුකිරීම සඳහා ස්වේච්ඡා සේවකයන්ට හැකියාව ලබාදීමට රාජ්‍යයන් ද්වීත්වය විසින් අවශ්‍ය යැයි සළකා බැලිය හැකි බැවින්, එක්සත් ජනපද රජය විසින් ස්වේච්ඡා සේවකයන්ට ද, සාම බලකායේ නියෝජිතයන්ටද, එවැනි සීමිත උපකරණ හා සැපයුම් ප්‍රමාණයක් සමගින් නියෝජිත කාර්ය මණ්ඩල ද සැපයිය යුතු ය.

2. මේ යටතේ භාවිත කිරීම සඳහා, එක්සත් ජනපද රජය හෝ එමගින් මුදල් සපයන ඕනෑම කොන්ත්‍රාත්කරුවකු විසින් ශ්‍රී ලංකාව තුළට ගෙන එන ලද හෝ අත්පත් කරගත් සියලුම උපකරණ, සැපයුම්, හා අනෙකුත් භාණ්ඩ හා සේවාවන් සියලුම බදුවලින් (අගය එකතුකළ බදු ඇතුලුව) රේගු බදු, හා අනෙකුත් අයකිරීම්වලින් ද නිදහස් කළ යුතු ය.

*IV වැනි වගන්තිය*

1. මෙම ගිවිසුම යටතේ එක්සත් ජනපද රජයේ වගකීම් වලින් නිදහස් කර ගැනීම සඳහා එම රජයට හැකිවන පරිදි, ශ්‍රී ලංකාවේ රජයට පිළිගත හැකි පරිදි, ශ්‍රී ලංකා රජය විසින් සාම සාධක නියෝජිතයෙක්ද, එවැනි නියෝජිත කාර්ය මණ්ඩලයක් ද (සාම බලකා නියෝජිතයා විසින් නම්කළ පරිදි සාම බලකා ගිවිසුම යටතේ කාර්යයන් සිදුකරන සේවකයන් හා පුද්ගලයන් ද ඇතුළුව), ස්වකීය කුටුම්භයන්ගේ කොටසක් වන සිය පවුල්වල සාමාජිකයන්ද පිළිගත යුතු ය. එසේ වුවත්, වෙනත් ඕනෑම ගිවිසුමක විධිවිධාන ප්‍රකාරව, සිය සාම බලකා වැඩකටයුතු වලින් පැන නැඟෙන සියලුම බදුවලින් හෝ ආදායමෙන්, ස්වකීය භාවිතය සඳහා ශ්‍රී ලංකාවට ගෙන එන ලද සිය පුද්ගලික දේපළ සම්බන්ධයෙන් සියලුම රේගු බදු සහ අනෙකුත් ගාස්තු වලින් ද, බලපත්‍ර ගාස්තු හැර සියලුම අනෙකුත් බදු හෝ වෙනත් අයකිරීම් (සංක්‍රමණික/වීසාපත් ගාස්තු ඇතුලුව) වලින්, ඉහත සඳහන් පුද්ගලයන් සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් හෝ ස්ථිර පදිංචිකරුවන් නොවන සිය කුටුම්භයන්ගේ කොටසක් වන ස්වකීය පවුල්වල සාමාජිකයන් නිදහස් කළ යුතු ය. මීට අමතරව, ඉහත සඳහන් පාර්ශ්වයන්ට විනිර්මුක්තීන් ලබා නොදිය යුතු අවස්ථාවන් හි හැර, ඉහත සඳහන් පුද්ගලයන් සහ ස්වකීය කුටුම්භයන්ගේ කොටසක් වන ස්වකීය පවුල්වල සාමාජිකයන් සඳහා එක්සත් ජනපදයේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල පරිපාලන හා තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ප්‍රදානය කරන තත්ත්වයට සමාන තත්ත්වයක් ප්‍රදානය කළ යුතු ය.

2. ගාස්තු හෝ අනෙකුත් අයකිරීම්වලින් තොරව, සාම බලකා නියෝජිතයන්, කාර්ය මණ්ඩලයට, හා මෙම ගිවිසුම යටතේ කාර්යයන් සිදුකරන පුද්ගලයන් සහ ස්වකීය කුටුම්භයන්ගේ කොටසක් වන සිය පවුල්වල සාමාජිකයන්ට, ශ්‍රී ලංකා රජය විසින් වාස බලපත්‍ර සහ වීසා බලපත්‍ර (බහු විධ ප්‍රවේශ වීසා) නිකුත් කළ යුතු ය.

*V වැනි වගන්තිය*

ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජනපද රජය හෝ එමගින් මුදල් ලබා දුන් ගිවිසුම්කරුවන් විසින් මෙම ගිවිසුමට අනුකූලව භාවිත කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගෙන එන ලද සියලුම අරමුදල්, ආයෝජන, සහ තැන්පතු අවශ්‍යතා හා විනිමය පාලන වලින් නිදහස් කළ යුතු ය. ශ්‍රී ලංකාව තුළ නීති විරෝධී නොවන ඉහළම විනිමය අනුපාතයකින් එවැනි අරමුදල් ශ්‍රී ලංකාවේ මුදල් බවට පරිවර්තනය කළ යුතු ය.

06 - 792/2

---

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියෝගය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, විදේශ කටයුතු අමාත්‍ය තිලක් මාරපන වන මම, කොරියානු ජනරජයේ ආණ්ඩුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග 2017 - 2019 වසරවල් සඳහා ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලෙන් ණය මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් 2017 නොවැම්බර් 29 වැනි දින එළඹී මූලික ගිවිසුමෙහි, මෙහි උපලේඛනයේ සඳහන් වන ගිවිසුමෙහි අදාළ වගන්තිවල මෙම ගිවිසුමෙහි 6 වැනි වගන්තියේ නියමයන්, බලාත්මක කිරීම අවශ්‍යවන ප්‍රමාණයට, ඉහත කී පනතේ විධිවිධානයන් ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලේ නියෝජිතයන්, කාර්ය මණ්ඩලය, පවුල්වල සාමාජිකයන් සහ කාර්යාලයට අදාළවිය යුතු යයි මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත් කරමි.

තිලක් මාරපන, පා.ම.
විදේශ කටයුතු අමාත්‍ය.

2018 ජුනි මස 04 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

2017 - 2019 වසර සඳහා ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදලෙන් ණය මුදල් ලබා ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කොරියානු ජනරජයේ ආණ්ඩුව අතර මූලික ගිවිසුම

2. ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නියෝජිතයන්ට, කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට මෙන්ම කාර්යාලයට පහත සඳහන් වරප්‍රසාද, මුක්තීන් හා ප්‍රතිලාභ ප්‍රදානය කළ යුතු ය.

(අ) නියෝජිතයන්, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා ;

i. විදේශ රටවල සිට ඔවුන් වෙත ප්‍රේෂණය කරනු ලබන පඩිනඩි හෝ දීමනා සම්බන්ධයෙන් හෝ ඒවා මත පනවනු ලබන ආදායම් බදු සහ වෙනත් පිස්කල් ගාස්තුවලින් නිදහස් කිරීම.

ii. එක් එක් නියෝජිතවරයා හා කාර්ය මණ්ඩල සාමාජිකයා සඳහා මෝටර් රථයක් ඇතුළුව පෞද්ගලික හා ගේ දොර බඩු භාණ්ඩ ආනයනය කිරීම හා සම්බන්ධ ගබඩා කිරීම, කරත්ත කුලිය හා සමාන සේවාවන් පිළිබඳ ගාස්තු හැර සෙසු කොන්සියුලර් ගාස්තු, රේගු ගාස්තු, තීරු බදු හා එම ස්වභාවයේ ගාස්තුවලින් නිදහස් කිරීම, නියෝජිතයන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් පැමිණි දින සිට මාස හයක් (6) ඇතුළත ආනයනය කර ඇත්නම් ඒවා පිළිබඳ ලියාපදිංචි ගාස්තු, වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තු හා රියදුරු බලපත්‍ර ගාස්තුවලින් නිදහස් කිරීම.

iii. කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පෞද්ගලික පාවිච්චිය සඳහා තීරුබදු/වෙනත් බදු රහිතව මෝටර් රථයක් ආනයනය කිරීමට හිමිකමක් ඇති ස්ථානීය පදනමින් බඳවාගත් ශ්‍රී ලාංකිකයින් හැර එක් එක් නියෝජිතයින් හා විදේශීය විශේෂඥ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා වූ මෝටර් රථයක් විශේෂ පාරිභෝජන ගාස්තුවලින් හා අගය එකතු කළ බදුවලින් නිදහස් කිරීම.

iv. ස්ථානීය පදනමින් බඳවාගත් ශ්‍රී ලාංකිකයන් හැර, නියෝජිතයින් හා කාර්ය මණ්ඩල සාමාජිකයින්, දේශීය වශයෙන් මිලදී ගන්නා විටෙක රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනත තුළින් දැනටමත් තීරු බදු රහිත වාහන ආනයනය කර ඇති වරප්‍රසාද හිමි පුද්ගලයන්ගෙන් හෝ වරප්‍රසාද හිමි සංවිධානවලින් හෝ බදු රහිතව මෝටර් වාහනයක් මිලදී ගැනීමට අවසර ලබාදෙනු ලැබේ.

v. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ඇතුල්වීමට, ඉන් පිටවී යාමට හා පැවරුම් කාලය තුළ එහි රැඳී සිටීමට අවසර, විදේශිකයින් ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය කඩිනම් කිරීම හා පහසු කරවීම සහ කොන්සියුලර් ගාස්තුවලින් නිදහස් කිරීම.

vi. නියෝජිතයින්, කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පැමිණීමේදී ; ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලධාරීන් විසින් ඔවුන් වෙත එක් මසක ප්‍රවේශ වීසා නිකුත් කිරීම, ඔවුන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පැමිණීමේදී, ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ පවත්නා ආගමන හා විගමන නීතිවලට අනුකූලව විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් බහුවිධ පිවිසුම් වාස වීසා නිකුත් කිරීම.

vii. නියෝජිතයින් හා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයට දැනුම් දීම හා නියෝජිතයන්ට හා කාර්ය මණ්ඩලවලට රාජකාරි කටයුතු ඉටුකිරීම සඳහා අවශ්‍යවන සියලුම රජයේ ආයතනවල සහයෝගය ලබා ගැනීම සඳහා නියෝජිතයන්ට, රාජ්‍යතාන්ත්‍රික හැඳුනුම්පත් ද අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට විදේශීය විශේෂඥයින්ගේ හැඳුනුම්පත්ද නිකුත් කිරීම සහ

viii. විශේෂඥ පිරිස් හා බැංකුවේ දූත කණ්ඩායම් පිළි ගැනීමට හා/හෝ පිටත් කිරීමට, විදේශ ගමන් බලපත්‍රයේ පාලනයෙන් බැහැරවන ගුවන් තොටුපළවලට/වරායවලට ඇතුළුවීමට නියෝජිතයින්ට විශේෂ අවසරපත් නිකුත් කිරීම ; ඉල්ලීමට/අවශ්‍යතාවට අනුව, වරාය වෙත ප්‍රවේශවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය හැකිය.

(ආ) කාර්යාලය සඳහා ;

(i) ගබඩා කිරීමේ ගාස්තු, ගැල් කුලී සහ එම ස්වභාවයේ වෙනත් ගාස්තු හැර රේගු ගාස්තු, තීරු බදු, එම ස්වභාවයේ වෙනත් ගාස්තු හැර රේගු ගාස්තු, තීරු බදු, එම ස්වභාවයේ වෙනත් ගාස්තුවලින් නිදහස් කිරීම, එමෙන්ම, කාර්යාල උපකරණ ආනයනය කිරීම පිළිබඳ ආනයන බලපත්‍ර සහ විදේශ විනිමය සහතික ලබා ගැනීමේ නිදහස් කිරීම.

(ii) සපයා දිය යුතු මෝටර්රථවල සංඛ්‍යාව දෙරටෙහි ආණ්ඩුවල බලධාරීන් එකඟත්වයකට එළඹ ඇත්නම් කාර්යාලයට අවශ්‍ය මෝටර් රථ රේගු බදුවලින් නිදහස්ව ආනයනය කිරීම හෝ විශේෂ පරිභෝජන බදුවලින් සහ අගය එකතු කළ බදුවලින් නිදහස්ව දේශීය වශයෙන් මිළදී ගැනීම.

(iii) කාර්යාලය වියදම් සඳහා විදේශවලින් ප්‍රේෂණය කරන ලද අරමුදල් මත හෝ ඒ සම්බන්ධයෙන් නියම කරන ලද ආදායම් බදුවලින් සහ අගය එකතු කළ බදු වලින් නිදහස් කිරීම.

(iv) කාර්යාල ගොඩනැගිලි බදු කුලී අගය එකතුකළ බදුවලින් නිදහස් කිරීම.

(ඇ) නියෝජිතයන්ගේ, කාර්ය මණ්ඩලයේ හා කාර්යාලයේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග

3. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් මෝටර් වාහන පසුකාලීනව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ තීරුබදු හෝ බදු නිදහස් කිරීම් හෝ වෙනත් ඒ හා සමාන වරප්‍රසාදයන්ට හිමිකම් නොමැති පුද්ගලයන්ට හෝ සමාගම්වලට විකුණන්නේ නම් එම වාහන රේගු බදු හා බදු ගෙවීම්වලට යටත් කළ යුතු ය.

4. ඉහත 2 වැනි ඡේදයේ (අ) (ii) සහ (ආ) (i) හා (ii) උප ඡේදවලට අනුකූලව, රේගු බදු, බදු හා ඒ හා සමාන ස්වභාවයේ වෙනත් අයකිරීම්වලින් නිදහස් භාණ්ඩ ආනයනය කරන නියෝජිතයන්, කාර්ය මණ්ඩල සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් මෙන්ම කාර්යාලයද, ආනයන හා ප්‍රති අපනයන විධිමත් ක්‍රියාපටිපාටීන්ට සහය වීම පිණිස, ශ්‍රී ලංකා රජයේ එකී කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන අධිකාරියට එම භාණ්ඩ පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතු ය.

5. නියෝජිතයින්, කාර්යාල හා ඔවුන්ගේ පවුල් මෙන්ම කාර්යාලයද මෙසේ රේගු බදු, බදු හා ඒ හා සමාන ස්වභාවයේ වෙනත් අයකිරීම්වලින් නිදහස්ව ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රති අපනයනය කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ විකිණීම හෝ ශ්‍රී ලංකා රජයේ අනුමැතිය මත ශ්‍රී ලංකා රජයට ලබා දීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති හා රෙගුලාසිවලට අනුකූලව සිදුකළ යුතු ය.

6. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ සමාන මෙහෙයුම් කටයුතුවල නිරතව සිටින ඕනෑම තුන්වන රාජ්‍යයකට අයත් හෝ ඕනෑම ජාත්‍යන්තර සංවිධානයකට අයත් මෙහෙයුම් නියෝජිතායතනයක නියෝජිතයන්ට, කාර්ය මණ්ඩල සාමාජිකයින්ට හෝ ඔවුන්ගේ පවුල්වලට සහ කාර්යලවලට ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ප්‍රදානය කරනු ලබන වරප්‍රසාද, නිදහස් කිරීම් හා ප්‍රතිලාභවලට වඩා අඩු නොවන ආකාරයට මෙම නියෝජිතයන්ට, කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා ඔවුන්ගේ පවුල්වලට සහ කාර්යාලයට ද වරප්‍රසාද, නිදහස් කිරීම් හා ප්‍රතිලාභ ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රදානය කළ යුතු ය.

06 - 792/3

---

**1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත**

4 වැනි වගන්තිය යටතේ නියෝගය

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, විදේශ කටයුතු අමාත්‍ය තිලක් මාරපන වන මම, ජර්මානු ෆෙඩරල් ජනරජයේ ආණ්ඩුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2018, මාර්තු 06 වැනි දින එළඹී ගිවිසුමේ, මෙහි උපලේඛනයේ සඳහන් වන එකී ගිවිසුමෙහි අදාළ වගන්තිවල නියමයන්, බලාත්මක කිරීමට අවශ්‍යවන ප්‍රමාණයට, ඉහත කී පනතේ විධිවිධාන ජර්මානු කර්මාන්ත හා වාණිජ නියෝජිත පිරිස සම්බන්ධයෙන් අදාළවිය යුතු යයි මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත් කරමි.

තිලක් මාරපන, පා.ම.
විදේශ කටයුතු අමාත්‍ය.

2018 ජුනි මස 04 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ශ්‍රී ලංකාවේ ජර්මානු කර්මාන්ත හා වාණිජ නියෝජිත පිරිසක් පත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ ජර්මානු ෆෙඩරල් ජනරජයේ රජය අතර වැඩපිළිවෙල***

2. මෙම නියෝජිත පිරිසේ අරමුණු වනුයේ, ජර්මනියේ ෆෙඩරල් ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම්, සංවිධාන සහ වෙළඳාම් සිදුකරන පුද්ගලයන් අතර වෙළඳ හා ආර්ථික සබඳතා ප්‍රවර්ධනය කිරීමයි. එමගින් දෙරටේ ව්‍යාපාරික සබඳතා ප්‍රවර්ධනය කිරීමයි. එමගින් දෙරටේ ව්‍යාපාරික සබඳතා සඳහා පහසුකම් සැලසිය යුතු අතර දෙපාර්ශ්වයට සිදුවන වාණිජ කටයුතු ප්‍රවර්ධනය කළ යුතු ය. මෙම නියෝජිත පිරිස විසින් ලාභය ඉලක්ක කරගත් අරමුණු සිදු නොකළ යුතු ය. එම නියෝජිත පිරිසගේ පිරිවැය දරා ගැනීමට හිලව් වශයෙන් එහි සේවාවන් වෙනුවෙන් ගාස්තු අය කිරීමට හිමිකම් ලබති.

3. ජර්මානු කර්මාන්ත හා වාණිජ මණ්ඩල සංගමයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අදාළ බලධාරියා සමග මෙම නියෝජිත පිරිස ලියාපදිංචි කළ යුතු ය. මෙම නියෝජිත පිරිස කොළඹ සිටිය යුතු ය. ශ්‍රී ලංකාවේ දී අදාළ කරගත හැකි නීතිරීතිවලට අනුකූලව, එමගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශභූමියේ අනෙකුත් ශාඛා කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා හැකිය. වෙනත් කරුණු අතර, ජර්මානු වෙළඳාම හා ආයෝජනය සමගින් ඉහත 2 ඡේදයේ සඳහන් අරමුණු සඳහා සහයෝගිතා වැඩපිළිවෙලකට එළඹීම සඳහා මෙම නියෝජිත පිරිසට හැකියාව පැවැතිය යුතු ය.

4. මෙම නියෝජිත පිරිස සඳහා ජර්මානු ෆෙඩරල් ජනරජයේ ආර්ථික කටයුතු හා බලශක්ති ෆෙඩරල් අමාත්‍යාංශය සහ ජර්මානු කර්මාන්ත හා වාණිජ මණ්ඩල සංගමයෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කළ යුතු ය. පිරිවැය ආවරණය කිරීමේ අරමුණින් නියෝජිත පිරිස වෙත ජර්මානු ෆෙඩරල් ජනරජය හෝ ජර්මානු කර්මාන්ත හා වාණිජ මණ්ඩල සංගමය මගින් සෘජු හෝ වක්‍රාකාර වශයෙන් සිදුකරන ගෙවීම් සඳහා සෘජු බදුවලින් නිදහස් කළ යුතු ය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ජර්මානු ෆෙඩරල් ජනරජයේ බැංකු ගිණුම් පවත්වාගෙන යෑම සඳහා මෙම නියෝජිත පිරිසට අවසරය ලබාදෙන අතර, මෙම නියෝජිත පිරිසට ලැබෙන ඕනෑම විදේශ මුදල් වටිනාකමක්, ජර්මානු ෆෙඩරල් ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර දෙදිශාවටම ඕනෑම අවස්ථාවක දී, සීමා කිරීමකින් තොරව නිදහසේ මුදල් හුවමාරු කරගත හැකිය.

5. ඉහත 2 ඡේදයේ නියමිත අරමුණු සඳහා ජර්මානු කර්මාන්ත හා වාණිජ මණ්ඩල සංගමයේ සම්බන්ධීකරණයෙන් හෝ ඒ වෙනුවට නියෝජිත පිරිස වෙනුවෙන් කටයුතු කරන පුද්ගලයන් සහ ස්වකීය පවුල්වල සාමාජිකයන් (කලත්‍රයන් සහ බාල වයස්කාර හෝ පුහුණුවීම්වල නියලුණ ළමයින්) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටි ජර්මානු ෆෙඩරල් ජනරජයේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හෝ කොන්සියුලර් කාර්යාලවල සාමාජිකයන් නොවෙති. එවැනි දූත මණ්ඩල හා කාර්යාලවල කාර්යය මණ්ඩලය වෙත ලබාදුන් වරප්‍රසාද හා විනිර්මුක්තීන් ඔවුන් විසින් භුක්ති නොවිඳිති.

6. මෙම විෂය පථයට අදාළ කරගත හැකි නීතිරීති සහ රෙගුලාසි සීමාව ඇතුළත කඩිනමින් ඉහත 5 ඡේදයේ නියමිත පුද්ගලයන් වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශක්නුවත් බලධාරීන් විසින් වාස බලපත්‍ර නිකුත් කළ යුතු ය. මෙම වාස බලපත්‍ර වලංගු කාලසීමාව තුළ බහුවිධ පිවිසුම හා පිටවීම සඳහා මෙම වාස බලපත්‍ර මගින් එය දරන්නාට හිමිකම තිබිය යුතු ය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික නීති රීතිවලට අනුකූලව, මූලික වශයෙන් මෙම බලපත්‍ර වර්ෂයක කාලයක් සඳහා නිකුත් කළ යුතු අතර වාර්ෂිකව නැවත අලුත් කළ යුතු ය. රැකියාවක නියළීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළට ඇතුල්වීමට පෙර එක් දූත මණ්ඩලයකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෘත්තීය කොන්සියුලර් කාර්යාලවලින් වීසා බලපතක ස්වරූපයෙන් වූ වාස බලපත්‍රයක් ලබාගත යුතු ය. බලපත්‍රයේ වලංගු කාල සීමාව දීර්ඝ කිරීමේ අයදුම්පත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේදී බාරදිය හැකිය.

7. නියෝජිත පිරිසගේ ස්වකීය කටයුතු සිදුකිරීම සඳහා ඉහත 5 ඡේදයේ නියමිත පුද්ගලයන් සඳහා වැඩ කාර්ය බලපත්‍ර අවශ්‍ය නොවෙති.

8. මෙම නියෝජිත පිරිස විසින් සේවයේ නියුක්ත කරවන ලද කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව, එම නියෝජිත පිරිස පත්කිරීම් අරමුණට සැලකිය යුතු ලෙස සාපේක්ෂ විය යුතු ය.

9. ආදායම් හා ප්‍රාග්ධනය මත බදු පැනවීම සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා ජර්මානු ෆෙඩරල් ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර අදාළ ගිවිසුමට අනුවද, මේ සඳහා අදාළ කරගත් හැකි නීති රීති හා රෙගුලාසිවලට අනුව ද ඉහත 5 ඡේදයේ සඳහන් පුද්ගලයන්ගේ වැටුප්, වේතන හා සමාන ඉපයුම් බදුකරණයට යටත් කළ යුතු ය.

10. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවතින නීති රීති, නියමයන් හා රෙගුලාසිවලට අනුව, රේගු බදු හා ස්වකීය පැමිණීමෙන් මාස 12ක් ඇතුළත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශ භූමියට ගෙන එන ලද පුද්ගලික දේපළ ආනයනය හා ප්‍රති අපනයනය මත අයකරන වෙනත් අයකිරීම්වලින් ඉහත 5 ඡේදයේ දැක්වෙන නියමිත පුද්ගලයන්ට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් නිදහස් කිරීමක් ප්‍රදානය කළ යුතු ය.

06 - 792/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.